හිතවත් පාරිභෝගිකය,

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කර ඇති පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ වන අවශ්‍යතාවයකට අනුව අප විසින් පිරිනමනු ලබන ඔබට අවශ්‍ය සහ සුදුසු වන බැංකු කටයුතු/සේවාවන් තෝරාගැනීමට ඔබට සහාය වීම සඳහා ප්‍රධාන තොරතුරු ලේඛන මාලාවක් [KFDs] අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන තොරතුරු ලේඛන මගින් විශේෂ පැකේජ ආශ්‍රිත ගිණුම සමග වන විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව මෙන්ම පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පවතින පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳවද පුළුල් අවබෝධයක් ලබාදේ.

කෙසේවුවත්, නෛතික සහ නියාමන වෙනස්කම් අනුව සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්හි වෙනස්කම් අනුව පහත දැක්වෙන ප්‍රධාන තොරතුරු ලේඛනයන්හි සඳහන් කරුණු සංශෝධනය වීම අවශ්‍ය බව කාරුණිකව සඳහන් කරනු ලැබේ.

ඔබට වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍යනම් කරුණාකර පහත පරිදි අප හා සම්බන්ධ වන්න.
www.nationstrust.com හෝ 24 පැය ඇමතුම් මධ්‍යස්ථානය:
011 4 711 411

පහත දක්වා ඇති ඔබගේ ඕනෑම ගිණුමකට අදාළව ඔබට යම් පැමිණිල්ලක් කිරීමට අවශ්‍යවන අවස්ථාවකදී පැමිණිලි දැන්වීම අඩංගු කෙටි ලිඛිත ප්‍රකාශයක් පහත ලිපිනයට අප වෙත ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. ඔබට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට අප සූදානම්.
පැමිණිලි විසඳීමේ නිලධාරී
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී, 242, යූනියන් පෙදෙස, කොළඹ 2
හෝ
දුරකථන අංක : [+94(0)11 4711411]/ විද්‍යුත් ලිපිනය [customerservice@nationstrust.com]



නේෂන්ස් ට්‍රස්ට් බැංක්ව පීඑල්සී පීකිවු 118 242, යූනියන් පෙදෙස,
කොළඹ 2

| ගිණුම් විස්තරය | පාරිභෝගිකයන්ට ඇති ප්‍රතිලාභ | ගාස්තු සහ අනෙකුත් බැංකු ගාස්තු වර්ග | ගිණුම විවෘත කිරීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| ජංගම ගිණුම් | | | | |
| නේෂන්ස් පුද්ගලික ජංගම ගිණුම<br><br>මෙය පොළී නොලබන ගිණුමක් වන අතර බැංකුවේ සාමාන්‍ය ජංගම ගිණුමයි | පුද්ගලීකරණය කරන ලද චෙක් පොත් | මාසික සේවා ගාස්තු- මාසික සාමාන්‍ය ශේෂය රු.10,000/-ට වඩා අඩුවෙන් පවතිනම් මෙම ගාස්තුව අයකෙරේ<br><br>ගිණුම වැසීමේ ගාස්තුව | ජංගම ගිණුම් බැංකුවේ සඳහාවන සම්මත ගිණුම් විවෘතකිරීමේ ආකෘති පත්‍ර සම්පූර්ණ කර පහත සඳහන් ලේඛනද සමග බැංකුවේ ඕනෑම ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය;<br><br>ජාතික හැඳුනුම්පතේ පිටපතක්<br><br>වලංගු විදේශ ගමන් බලපත්‍රයක් පදිංචි ලිපිනය, ජාතික හැඳුනුම්පතේ ලිපිනයට හෝ ගමන් බලපත්‍රෙය් ලිපිනයට වඩා වෙනස් පදිංචිය වන්නේ තහවුරු කිරීම නම් සඳහා ලේඛන සාක්ෂි අවශ්‍ය වේ | **සුදුසුකම්ලත් පුද්ගලයින්:**<br><br>ශ්‍රී ලංකාව තුළ පදිංචි වයස අවුරුදු 18ට වඩා වැඩි, වලංගු ජාතික හැඳුනුම්පතක්/ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයින්.<br><br>අවම මූලික තැනුපතුව රු. 10,000කි.<br>ගිණුමේ අවම ශේෂය පවත්වාගෙන නොයන්නේ නම් සේවා ගාස්තුවක් අයකරනු ඇත . අයිරා මගින් පවා මෙම ගාස්තු අයකර ගත හැකිය. |

නේෂන්ස් ට්‍රස්ට් බැංක්ව පීඑල්සී පීකිවු 118 242, යූනියන් පෙදෙස, කොළඹ 2